සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# තෙවන වාර පරීක්ෂණය 2018

**10 ශ්‍රේණිය** **ඉතිහාසය - I** **කාලය පැය 01 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

**සැලකිය යුතුයි :**

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවලට දී ඇති (i), (ii), (iii) සහ (iv) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

01. ක්‍රි.පූ. 250 දී පමණ සිට ලංකාවේ කාසි භාවිතය ආරම්භ විය. ලංකාවෙන් හමුවන පැරණිතම කාසි වර්ගය හඳුන්වන නම කුමක් ද?
(1) කහාපන (2) මස්ස (3) ඇතා හා ස්වස්තිකය (4) පනම

02. කිසි විටෙක ලංකාවට නොපැමිණ ලංකාව පිළිබඳ තොරතුරු වාර්තා කළ රචකයෙකු වන්නේ,
(1) මෙගස්තිනිස්ය (2) ෆාහියන් හිමිය (3) රිබෙයිරෝය (4) පිලිප්පස් බැල්දියස්ය

03. ප්‍රාග්ඓතිහාසික යුගයට අයත් සාධක හමුවන ඉරණමඩු සැකැස්ම නිර්මාණය වූ අවධිය කුමක්ද?
(1) මහා හිම යුගය (2) හොලෝසින යුගය (3) ප්ලයිස්ටොසින යුගය (4) මෙගලිතික යුගය

04. මුල් ඓතිහාසික යුගය සම්බන්ධයෙන් අදාළ නොවන ප්‍රකාශය තෝරන්න.
(1) ස්ථිරවාසීතාවය
(2) වැසි ජලය ගබඩාකරගැනීම සඳහා වැව් ඉදිකිරීම
(3) වැව් බැම්මේ එක් කෙළවරක ජනාවාස පිහිටා තිබීම
(4) කේන්ද්‍රගත වූ දේශපාලන බලය

05. මුල් ඓතිහාසික යුගයේ ජනාවාස, ගංගා නිම්න තුළට අවතීර්ණවන ආකාරය පිළිබඳ තොරතුරු අනාවරණය වූයේ කුමන ගංගා නිම්නයක සිදුකරන ලද අධ්‍යයනයක් මගින් ද?
(1) වළවේ ගංගා නිම්නය (2) ගල් ඔය නිම්නය
(3) කිරිඳි ඔය නිම්නය (4) කනගරායන් ආරු නිම්නය

06. පහත සඳහන් ජනපදයන් අතරින් ශ්‍රීමහබෝධි උත්සවයට දේවානම්පියතිස්ස රජතුමා ආරාධනා කරන ලද ක්ෂත්‍රිය ජනපද පමණක් අඩංගු පිළිතුර තෝරන්න.
A - රෝහණ B - කල්‍යාණි C - චන්ද්‍රනගාම D - කතරගම
(1) AB (2) BC (3) CD (4) AD

07. රෝමානුක දේශයට දූතයන් යවා වීදුරු පබළු ගෙන්වා රුවන්වැලි සෑයට පූජාවක් පැවැත්වූ පාලකයා කවුරුන්ද?
(1) දුටුගැමුණු රජතුමා (2) භාතිකාභය රජතුමා (3) වසභ රජතුමා (4) බුවනෙකබාහු රජතුමා

08. ශ්‍රී ලංකාවේ රාජකීයයන් විසින් භාවිත කළ මුද්‍රාවක ඡායාරූපයක් මෙහි දක්වේ. මෙම මුද්‍රාව හමුවූ ස්ථානය කුමක් ද?
(1) තිස්සමහාරාමයේ නාගරික ගොඩැල්ලෙනි
(2) උඩරංචාමඩම නාගරික ප්‍රදේශයෙනි
(3) ගොඩවාය වරායෙනි
(4) පැරණි මාගම නගරයෙනි



09. පහත වගුවේ I තීරුවේ රාජ්‍ය පාලනය සම්බන්ධ වූ නිළධාරි පිරිසක් ද II තීරුවේ ඔවුන්ගේ කාර්යභාරයන් කිහිපයක් ද දැක්වේ. ඒවා නිවැරදිව ගැලපූ විට අදාළ පිළිතුර වන්නේ මින් කුමක් ද?

| I තීරුවේ | II තීරුවේ |
|---|---|
| 1. බතගු | A - කාසි අච්චුගැසීමේ ප්‍රධානී |
| 2. කොතුරුගෑනා | B - රාජ්‍ය ලේඛනාගාර ප්‍රධානී |
| 3. රූප අදෙක | C - භෝජනශාලාධිකාරී |
| 4. පන අදෙක | D - චාරිත්‍ර පිළිබඳ අධිකාරී |
| | E - වෙළඳ කටයුතු භාර ප්‍රධානී |

(1) CDA හා E (2) CDE හා A (3) DBA හා E (4) EDA හා E

10. පැරණි සාහිත්‍ය ග්‍රන්ථවල, ධනයට අධිපති දෙවියන් වූ කුවේරයන් නමින් පෙනී සිටීමට උත්සාහ කළ කාශ්‍යප රජතුමාගේ වාසභවන ලෙස තෝරාගත් ස්ථානය හැඳින්වූ නම කුමක් ද?

(1) ආලකමන්දාව (2) හිමගිර (3) ගිරි දිවයින (4) තම්බපණ්ණි

11. පහත සඳහන් සළකුණු අතරින් රාජකීයත්වය හා පවිත්‍රත්වය නිරූපණය වන සළකුණු ඇතුළත් පිළිතුර කුමක් ද?

A - පුන්කලස B - ඉර හඳ C - වටාපත D - හංසයා

(1) A හා C (2) B හා D (3) B හා C (4) C හා D

12. අතීතයේ බොහෝ වෙළෙන්දෝ වෙළඳ සමූහ වශයෙන් සංවිධානය වී කටයුතු කරන ලදී. එවැනි වෙළෙඳ සමූහ හඳුන්වා ඇත්තේ කෙසේ ද?

(1) අබල වපර නමිනි (2) වණිජ නමිනි (3) නියමස්ථාන නමිනි (4) කාල සුමන නමිනි

13. ශ්‍රී ලංකාව සරන්ඩිබ් යනුවෙන් හඳුන්වා ඇති දැනට සොයාගෙන ඇති පැරණිතම අරාබි භූගෝල විද්‍යා ග්‍රන්ථය මින් කුමක් ද?

(1) අල් - මස්ලික්වාල් - මමාලික් (2) අජායිබ් අල් - හින්ද්

(3) භූගෝල ශාස්ත්‍ර ප්‍රවේශය (4) ඉබන් බතුතාගේ වාර්තා

14. මහාවංශ ටීකාවේ සඳහන්වන ආකාරයට බ්‍රාහ්මණයින් ආගමික කටයුතු කරන ගොඩනැගිල්ල හඳුන්වා ඇති පිළිතුර තෝරන්න.

(1) පණ්ණශාලා (2) සිවිකාශාලා (3) පධානඝර (4) සොත්ථිශාලා

15. පැරණි ශිලාලේඛන වල අඩික යනුවෙන් හඳුන්වා ඇත්තේ,

(1) මහාමාර්ග ඉදිකිරීම සම්බන්ධ නිළධාරියෙකි.

(2) ඇළ මාර්ග ඉදිකිරීම සම්බන්ධ කටයුතු කළ අයෙකි.

(3) අධ්‍යාපන ආයතනයක ප්‍රධානියෙකි.

(4) වෙළඳ ආයතන ප්‍රධානියෙකි.

16. පහත සඳහන් පාලකයින් අතරින් ගව්වෙන් ගව්ව සෙල්ලිපි පිහිටුවීමට නියෝග කළ පාලකයා කවුරුන් ද?

(1) කිත්සිරිමෙවන් රජතුමා (2) දෙවෙනි පරාක්‍රමබාහු රජතුමා

(3) කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජතුමා (4) පළමු විජයබාහු රජතුමා

17. පැරණි සමාජයේ ප්‍රභූවරුන්ගේ මට්ටමට පහළින් සිටි රටේ සාමාන්‍ය ජනතාව සෙල්ලිපිවල හඳුන්වා ඇති නාමය කුමක් ද?

(1) කුඩීන් (2) රද්කොල් සමිදරු (3) ධනක්කීතදාස (4) අන්වායාතදාස

18. පළමුවන විජයබාහු රජතුමාට ආරක්ෂාව සලසන ලද සිත්නරුබිම් බුදල්නා නම් දණ්ඩනායකයෙකු පිළිබඳව සඳහන් වන අභිලේඛනය වන්නේ මින් කුමක් ද?

(1) වල්ලිපුරම් රන්පත (2) අඹගමුව සෙල්ලිපිය

(3) පනාකඩුව තඹ සන්නස (4) හෝපිටිගමුව ටැම් ලිපිය

- **පහත වගුවේ A - I තෙක් තොරතුරු ඇසුරින් 19 - 20 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| යුගය | පාලකයා | නිර්මාණය |
|---|---|---|
| A - අනුරාධපුරය | D - III විජයබාහු රජතුමා | G - විජයසුන්දරාරාමය |
| B - පොළොන්නරුව | E - මහසෙන් රජතුමා | H - උත්තරාරාමය |
| C - යාපහුව | F - I පරාක්‍රමබාහු රජතුමා | I - ජේතවනාරාමය |

19. A යුගය හා සම්බන්ධ පාලකයා හා නිර්මාණය ඇතුළත් පිළිතුර කුමක් ද?
    (1) E හා H  (2) E හා I  (3) F හා I  (4) D හා H

20. F හි සඳහන් පාලකයා හා සම්බන්ධ යුගය හා නිර්මාණය ඇතුළත් පිළිතුර ලියන්න.
    (1) B හා I  (2) C හා H  (3) B හා G  (4) B හා H

21. පහත සිදුවීම් අතරින් දඹදෙණි යුගයට අයත් සිදුවීම ඇතුළත් පිළිතුර තෝරන්න.
    (1) පාණ්ඩ්‍ය හමුදාව ලංකාවට පැමිණ දළදා වහන්සේ රැගෙනයාම.
    (2) කාලිංගරායර්ගේ ආක්‍රමණය
    (3) චන්ද්‍රභානුගේ ආක්‍රමණය
    (4) වෙළෙඳ සබඳතා ගොඩනගාගැනීම සඳහා ඊජිප්තුවට තානාපති වරු පිරිසක් යැවීම

22. සුදු ඇතෙකු තබාගෙන සිටි අල්කෝනාර් නම් ස්වාධීන පාලකයෙකු පිළිබඳ තොරතුරු වාර්තා කළ විදේශීය වාර්තාකරුවා කවුද?
    (1) ෆාහියන්  (2) ඉබන්බතුතා  (3) ඉත් සිං  (4) කොස්මස්

23. ''සිංහල සංගය'' නම් කැරැල්ල මර්ධනය කළ පාලකයා වන්නේ මින් කවරෙක් ද?
    (1) හයවන පරාක්‍රමබාහු රජුය  (2) හයවන විජයබාහු රජුය
    (3) අටවන වීර පරාක්‍රමබාහු රජුය  (4) හයවන බුවනෙකබාහු රජුය

24. කාව්‍යකරණය පිළිබඳ නීති ඇතුළත් කෘතිය වන්නේ,
    (1) එළු සඳැස් ලකුණ  (2) කව්සිළුමිණ
    (3) බුත්සරණ  (4) සමන්තකූට වර්ණනාව

- **25 - 28 දක්වා ප්‍රශ්නවලට සපයා ඇති ලංකා සිතියම ඇසුරින් පිළිතුරු සපයන්න.**




25. කෝනේශ්වරම් හින්දු දේවාලය පිහිටා ඇති ස්ථානය දැක්වෙන අක්ෂරය වන්නේ මින් කුමක් ද?
    (1) A  (2) B
    (3) C  (4) D

26. විජයබා කොල්ලයේ දී මායාදුන්නේ කුමරුට යුධ ආධාර සපයා දුන් පාලකයාගේ පාලන මධ්‍යස්ථානය දැක්වෙන අක්ෂරය වන්නේ,
    (1) A  (2) C
    (3) D  (4) E

27. නිශ්ශංක අලගක්කෝණාර විසින් බලකොටු නගරයක් ලෙස ඉදිකරන ලදුව හයවන පැරකුම් රජු විසින් ලංකාවේ අගනගරය බවට පත්කරගත් ස්ථානය දැක්වෙන පිළිතුර කුමක් ද?
    (1) A  (2) B
    (3) D  (4) E

28. පහතරට තෙත් කලාපයේ පිහිටා ඇති ප්‍රාග්ඓතිහාසික යුගයේ මානව ජනාවාසයක් දැක්වෙන අක්ෂරය වන්නේ මින් කුමක් ද?
    (1) A  (2) B  (3) C  (4) D

29. හළු වඩන නිලමේ, බත් වඩන නිලමේ යන නිලධාරීන් උඩරට රාජධානි පරිපාලන ව්‍යුහයේ කුමන ආයතනය සම්බන්ධ නිලධාරීන් ද?
    (1) රටවසම  (2) විහාරදේවාල  (3) මහවාසල  (4) බද්දේ

30. ඉතා පුරාණ කාලයක සිට අපේ මුතුන් මිත්තන් යකඩ නිස්සාරණය කිරීමේ තාක්‍ෂණය පිළිබඳව දැනසිටි බවට සාක්‍ෂි සොයාගත් ස්ථානයක් වන්නේ මින් කුමක් ද?
   (1) බෙරගල (2) ඉබ්බන්කටුව (3) උඩරංඩාමඩම (4) බණ්ඩාරවෙල

31. ''කටුපුල්ලේ'' යන නිළධාරියාගේ කාර්යභාරය වන්නේ මින් කුමක් ද?
   (1) තොරතුරු වාර්තා කිරීම
   (2) අධිකාරම්වරයාට ආරක්ෂාව සැපයීම
   (3) ආදායම් රැස්කිරීම
   (4) අධිකාරම්වරයාගේ පණිවිඩ ගෙනයාම

- **පහත ABCD වලින් දැක්වෙන ප්‍රකාශ/පද යුගල අධ්‍යයනය කර 32 හා 33 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

A - 1. කුරුස යුද්ධය
    2. ග්‍රීක රෝම සංස්කෘතිවල පිබිදීම

B - 1. ඉරාස්මස්
    2. පුනරුද සමයේ ගත්කතුවරු

C - 1. ප්‍රායෝගික ඉංජිනේරුවරයෙකු වීම
    2. ලියනාඩෝ ඩාවින්චි

D - 1. පුනරුද සමයේ කලාව
    2. මෙඩිසි පවුල

32. පළමු වැන්නේ වර්ධනය සඳහා දෙවැන්න හේතු වූ බව පෙන්වන ප්‍රකාශ/පද යුගලය කුමක් ද?
   (1) A (2) B (3) C (4) D

33. පළමුවැන්න හා දෙවැන්න අතර සබඳතාවක් නොපෙන්වන ප්‍රකාශය / පද යුගලය කුමක් ද?
   (1) A (2) B (3) C (4) D

34. සිස්ටයින් දෙව් මැදුරේ ඇඳ ඇති ආදම්ගේ චිත්‍රය අඳින ලද්දේ කවුරුන් විසින් ද?
   (1) ලියනාඩෝ ඩාවින්චි (2) රෆායල් (3) මයිකල් ආන්ජිලෝ (4) බොට්ටිචෙල්ලි

35. පුනරුද සමයේ විද්‍යාවට දැක්වූ සුවිසල් සේවය නිසා ''නූතන තාරකා විද්‍යාවේ පියා'' ලෙස හඳුන්වනු ලබන්නේ මින් කවුරුන්ද?
   (1) නිකලස් කොපර්නිකස් (2) අයිසෙක් නිවුටන්
   (3) ජොහැන්ස් කෙප්ලර් (4) ගැලීලියෝ ගැලීලි

36. දේශගවේෂණ ව්‍යාපාරයේදී බර්තොලමියු ඩයස් අහම්බෙන් ගොඩබට දකුණු අප්‍රිකානු ප්‍රදේශය වන්නේ මින් කුමක් ද?
   (1) මැගලන් සමුද්‍ර සන්ධිය (2) කුණාටු තුඩුව
   (3) කැලිකට් වරාය (4) කොමරින් තුඩුව

37. පුනරුදය මුලින්ම ආරම්භ වූයේ,
   (1) කොන්ස්තන්තිනෝපල් නගරයෙනි (2) වතිකානුවෙනි
   (3) ප්ලෝරන්ස් නගරයෙනි (4) බොහිමියාවෙනි

38. ධර්මපාල රජු තෑගි ඔප්පුවකින් නීත්‍යානුකූල අයිතිය පෘතුගීසීන්ට පැවරූ රාජධානිය වන්නේ මින් කුමක් ද?
   (1) සීතාවක (2) කෝට්ටේ (3) කුරුණෑගල (4) දඹදෙණිය

39. පෘතුගීසීන් ලංකාවට පැමිණෙන අවධියේ යාපන ප්‍රදේශයේ පාලකයා වූයේ මින් කවරෙක් ද?
   (1) පරරාජසේකරම් (2) සංකිලි (3) පුවිරාජපණ්ඩාරම් (4) එදිරිමානසිංහම්

40. ක්‍රි.ව. 1602 වර්ෂයේ දී පළමු විමලධර්මසූරිය රජු මුණගැසුන ජොරිස් වැන් ස්පිල්බර්ජන් කුමන ජාතිකයෙක් ද?
   (1) ප්‍රංශ (2) පෘතුගීසි (3) ඉංග්‍රීසි (4) ලන්දේසි

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# තෙවන වාර පරීක්ෂණය 2018

**10 ශ්‍රේණිය** **ඉතිහාසය - II** **කාලය පැය 03 යි.**

| නම/ විභාග අංකය: |
|---|

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- II කොටසින් ප්‍රශ්න 4 ක් ද, III කොටසින් එක් ප්‍රශ්නයක් ද තෝරාගෙන පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

## I - කොටස

(01) (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද, (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියමෙහි ද ලකුණු කොට නම් කරන්න.

(i) කලාඔය, ගල්ඔය, මඩකලපුව, මීගමුව, මාගම, සීගිරිය, පල්ලවංක, මාන්තායි, ඉරණමඩු වැව, රයිගම, නාච්චදූව, කල්පිටිය (ල.12)

(ii) කැලිකට්, පර්සියන් බොක්ක, රෝමය, තායිවානය, ප්‍රංශය, කොරියානු අර්ධද්වීපය (ල.06)

(ආ) (i) පහත A, B, C, D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ පුද්ගලයින් කවුරුන්දැයි අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A ''මට සේවය කරන හිතවත් ලන්දේසි ජාතිය'' වැනි යෙදුම් භාවිත කරමින් ලන්දේසීන් වෙත ලිපි ලියූ ත්‍රි සිංහලාධීශ්වර විරුදය දැරූ උඩරට පාලකයා.

B පෘතුගීසීන් හා කෝට්ටේ රාජ්‍ය සමග සටන් කිරීම සඳහා කැලිකට් හි සැමෝරින්ගෙන් ආධාර ලබාගත් පාලකයා.

C බලන සටන මෙහෙය වූ පෘතුගීසි කපිතාන් ජනරාල් වරයා.

D දඹදෙණි යුගයේ දී බුද්ධ පුත්‍ර හිමියන් විසින් රචනා කරන ලද වෛද්‍ය විද්‍යාත්මක ග්‍රන්ථය.

- A හා B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු අංක අනුපිළිවෙලින් ලියන්න.

(ii) 1. A වලින් දක්වෙන නිර්මාණය කුමක් ද?
2. මෙය කුමන කාර්යයක් සඳහා ප්‍රයෝජනය ගන්නා ලද්දක් ද?
3. මෙය ක්‍රියාකරවීමට ඉන්ධන වශයෙන් ප්‍රයෝජනයට ගත්තේ මොනවා ද?
4. මෙම නිර්මාණය ආශ්‍රිත කර්මාන්තය සඳහා යොදාගත් පාෂාණ වර්ගයක රසායන විද්‍යාත්මක නාමයක් ලියන්න. (ල.04)



A

(iii) 1. B රූපයෙන් දක්වෙන පුද්ගලයා කවුරුන් ද?

2. ඔහු භාවිත කරන උපකරණය කුමක් ද?

3. ඉහත නිර්මාණය භාවිත කර හඳුනාගත් සොයාගැනීමක් නම් කරන්න.

4. මෙම පුද්ගලයා හැඳින්වීම සඳහා යොදාගත් අන්වර්ථ නාමයක් ලියන්න. (ල.04)



B

---

## II - කොටස

(02) (i) මහා වංශය රචනා කිරීම සඳහා මූලාශ්‍රය කරගත් ග්‍රන්ථ 03 ක් නම් කරන්න. (ල.03)

(ii) ඉතිහාසය ගොඩනැගීම සඳහා සාහිත්‍ය මූලාශ්‍රය යොදාගැනීමේ දී සැළකිලිමත් විය යුතු කරුණු 04 ක් ලියන්න. (ල.04)

(iii) ඉතිහාසය හැදෑරීමේදී නාණක මූලාශ්‍රවල ඇති ප්‍රයෝජනය පිළිබඳ කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ල.05)

(iv) ඉතිහාසය හැදෑරීමේ ඇති ප්‍රයෝජන කරුණු තුනක් ඇසුරින් විස්තර කරන්න. (ල.06)

03 (i) ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය සම්බන්ධයෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.(ල.03)

A - ශ්‍රී ලංකාව ජනාවාස කරන ලදැයි සැලකෙන ආදි මානවයා.

B - ශ්‍රී ලංකාවේ ගල් යුගයට අයත් සාධක හමුවන ප්‍රධාන ප්‍රදේශ දෙක.

(ii) A - ප්‍රාග්ඓතිහාසික යුගයේ මුල් මානවයා විශාල පාෂාණ යොදාගනිමින් සාදාගන්නා ලද ශිලා මෙවලම් හැඳින්වූ නම කුමක් ද?

B - තාක්ෂණයේ දියුණුවත් සමග ගල් යුගයේ මානවයා විසින් නිර්මාණය කරගන්නා ලද දියුණු ශිලා මෙවලම් වර්ගය කුමක් ද?

C - එම ශිලා මෙවලම් සකස්කර ගැනීම සඳහා බහුල වශයෙන් භාවිතකළ පාෂාණ වර්ගය කුමක් ද?

D - මෙම මානවයා ශිලා මෙවලම් තනාගැනීමේදී භාවිත කළ තාක්ෂණික ක්‍රමවේදය කුමක් ද? (ල.04)

(iii) ප්‍රාග් ඓතිහාසික ගල් යුගයේ මානවයාගේ අභිචාර විධි සම්බන්ධව සාධක හමුවන ස්ථාන දෙකක් නම් කර ඔවුන්ගේ අභිචාර විධි පිළිබඳ විස්තර කරන්න. (ල.04)

(iv) පූර්ව ඓතිහාසික යුගයේ මානවයා තාක්ෂණය භාවිත කළ අවස්ථාවන් තුනක් නම් කර ඒ ඇසුරින් ඔවුන්ගේ තාක්ෂණ භාවිතය පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න. (ල.06)

04 (i) ශ්‍රී ලංකාවේ පූර්ව රාජ සමයට අයත් වූ පහත කාර්යයන් හා සම්බන්ධ පුද්ගලයින් ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු වරහන තුළින් තෝරා අනුපිළිවෙලින් ලියන්න. (ල.03)

A - කුඩා ප්‍රදේශවල සිය බලය පවත්වාගෙන සිටි වත්පොහොසත්කම් ඇති ප්‍රභූ පිරිස.

B - තොටුපළ ආශ්‍රිත ගම් වල බදු අය කළ තැනැත්තා

C - නැගෙනහිර ප්‍රදේශයේ රජු.

(ගෘහපති / පරුමක / ගමික / පොවති රජ / තොට බොජක)

(ii) පහත සඳහන් එක් එක් කරුණට / සිදුවීමට සම්බන්ධ පාලකයන් කවුරුන්දැයි අනුපිළිවෙලින් ලියා දක්වන්න. (ල.04)

A - ලංකාවේ පළමුවතාවට ග්‍රාමසීමා ලකුණු කිරීම.

B - ලංකාව ආස්ථාන වලට බෙදා වෙන්කොට පාලනය කිරීම.

C - නරේශ්වර යන විරුදනාමය දැරීම.

D - ශ්‍රී ලංකාවේ දේශපාලන බලය විමධ්‍යගතව පැවති අවධියේ රජු හැඳින්වීමට භාවිතා කළ නාමය

(iii) අතීත පාලකයින් ජනතාවගේ සනීපාරක්ෂාව හා ස්වස්ථතාවය සඳහා ගත් ක්‍රියා මාර්ග උදාහරණ දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ල.05)

(iv) අතීත පාලකයන් අවට රාජ්‍යයන් සමඟ සුහදව කටයුතු කළ ආකාරය උදාහරණ තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල.06)

05 (i) පැරණි සමාජයේ, නිෂ්පාදන භුක්ති විඳිමින් ප්‍රභූන් ලෙස කටයුතු කළ කණ්ඩායම් 03 ක් නම් කරන්න. (ල.03)

(ii) පහත සඳහන් තොරතුරු සඳහන් මූලාශ්‍රය කුමක්දැයි වරහන් තුළින් තෝරා පිළිවෙලින් ලියන්න. (ල.04)

A - චූල සීවලී නම් රැජිනක් පිළිබඳ තොරතුරු සඳහන් වීම.

B - සූප ශාස්ත්‍රයේ දක්ෂ කාන්තාව මධුපාචිකා ලෙස හැඳින්වීම.

C - පරුමකලු සමනා නම් කාන්තාවක් පිළිබඳව තොරතුරු සඳහන් වීම.

D - මිනීමැරුමට එල්ලා මැරීමේ දඬුවම ලබාදිය යුතු බව සඳහන් වීම.

(වේවැල්කැටිය ලිපිය / සහස්සවත්ථුප්පකරණය / බ්‍රාහ්මණයාගම ලිපිය / සද්ධර්මාලංකාරය / ලාහුගල නිල්ගිරි සෑය ලිපිය / තෝනිගල ලිපිය)

(iii) උදාහරණ දෙකක් ඇසුරින් අතීත පාලකයින් පරිසරය ආරක්ෂා කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග පිළිබඳ විස්තර කරන්න. (ල.05)

(iv) ධනවත් පිරිස් ජීවත් වන ජනාවාසවල දක්නට ලැබෙන කැපී පෙනෙන ලක්ෂණ 03 ක් නම් කර අතීත නාගරීකරණය පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ල.06)

06 (i) කාලිංග මාඝගේ ආක්‍රමණයත් සමඟ ස්වදේශික නායකයින් ආරක්ෂිත ස්ථානවල පිහිටුවාගත් ස්වාධීන පාලන මධ්‍යස්ථාන 03 ක් නම් කරන්න. (ල.03)

(ii) පහත සඳහන් ඓතිහාසික සිදුවීම් හා සම්බන්ධ පාලන යුගයන් නම් කරන්න. (ල.04)

A - චීන ආක්‍රමණය

B - ශ්‍රී ලංකාව අවසාන වතාවට එක්සේසත් කිරීම

C - බෙලිගල දළදා මැදුර ඉදිකිරීම

D - අනාගත වංශය නම් ග්‍රන්ථය රචනා කිරීම

(iii) රජරට ශිෂ්ටාචාරය බිඳවැටීමෙන් පසු ලංකා ආර්ථිකයේ සිදුවූ වෙනස්කම් දෙකක් ඇසුරින් එම යුගයේ ආර්ථික තත්වය පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ල.05)

(iv) දෙවන නාගරීකරණය සමයේ භාෂාව හා සාහිත්‍යයේ වර්ධනයට බලපෑ සාධක දෙකක් ඇසුරින් එම යුගයේ සාහිත්‍ය ප්‍රබෝධය සිදුවූ අයුරු විස්තර කරන්න. (ල.06)

07 (i) මහනුවර රාජ්‍යයේ ආරම්භය සම්බන්ධයෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අනුපිළිවෙලින් ලියන්න. (ල.03)

A - උඩරට මුල්වතාවට ස්වාධීන පාලනයක් ගොඩනගන ලද පුද්ගලයා

B - එම අවධියේ ලංකාවේ අගනගරය

C - එවකට එහි සිටි පාලකයා

(ii) පහත සඳහන් තොරතුරු හා සම්බන්ධ පුද්ගලයින් කවුරුන්දැයි අනුපිළිවෙලින් සඳහන් කරන්න. (ල.0)

A - සීතාවක රාජසිංහ රජුට උඩරට ආක්‍රමණය කිරීම සඳහා සහාය ලබාදුන් උඩරට ප්‍රභූවරයා

B - සෙනරත් රජුගේ අවධියේ මාතලේ ප්‍රදේශයේ පාලනය පැවරුන කුමාරයා

C - ඉංග්‍රීසීන් ලංකාවේ වෙරළබඩ ප්‍රදේශයේ බලය අල්ලාගන්නා අවධියේ උඩරට පාලකයා

D - දළදා මාලිගාවේ කටයුතු භාර වූ නිලධාරියා

(iii) පළමුවන විමලධර්මසූරිය රජතුමා රාජ්‍යත්වයට පත්වීමේ දී මුහුණ දුන් අභියෝග 02 ක් දක්වා ඔහු තමන්ට එල්ල වූ අභියෝග ජයගත් අන්දම පැහැදිලි කරන්න. (ල.02)

(iv) මහනුවර යුගයේ රාජ්‍ය පරිපාලන සංවිධානය තුළ රජතුමාට හිමි බලතල තුනක් දක්වා ඒ ඇසුරින් රජුගේ කාර්යභාරය පිළිබඳ විමසන්න. (ල.02)

---

## III - කොටස

(08) (i) පුනරුද සමයේ ගෘහ නිර්මාණ ශිල්පයේ ප්‍රධාන ලක්ෂණ තුනක් ලියන්න.

(ii) පුනරුද සමයේ පහත සඳහන් නිර්මාණ හා සොයාගැනීම් සිදුකළ පුද්ගලයින් වරහන තුළින් තෝරා අනුපිළිවෙලින් ලියා දක්වන්න.

A - මුද්‍රණ යන්ත්‍රය

B - ලෝරාට සැහැලි කවි ග්‍රන්ථය

C - මෝසෙස්ගේ ප්‍රතිමාව

D - නවලෝකය සොයාගැනීම

(මයිකල් ආන්ජිලෝ / ලියනාඩෝ ඩාවින්චි / ජොහැන්ස් ගුටන්බර්ග් / ඇමරිගෝ වෙස් පූෂි / ඩාන්ටේ)

(iii) වැඩවසම් යුගයේ දේශපාලනයේ ප්‍රධාන ලක්ෂණ දෙකක් නම් කර එම යුගයේ දේශපාලන තත්වය පුනරුද යුගයේ දී වෙනස් වූ ආකාරය විස්තර කරන්න.

(iv) පුනරුදය ලංකාවේ දේශපාලනය කෙරෙහි බලපෑ ආකාරය වෙනස්වීම් තුනක් ඇසුරින් විස්තර කරන්න.

09 (i) යුරෝපා ජාතීන් ආසියාවට පැමිණීමේ ප්‍රධාන අරමුණු තුනක් නම් කරන්න. (ල.03)

(ii) පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න. (ල.04)

A - වර්තමානයේ කොන්ස්තන්තිනෝපල් නගරය හඳුන්වන නම

B - සෙයිලාන් ද්වීපය සොයාගන්නා ලෙස උපදෙස් ලබාදී පෘතුගාල පාලකයා විසින් පෙරදිග පෘතුගීසි ප්‍රතිරාජයා ලෙස පත්කර එවන ලද තැනැත්තා

C - ධර්මපාල රජුගේ පියා

D - 1766 දී ලන්දේසීන් සමඟ ගිවිසුමක් අත්සන් කළ උඩරට පාලකයා

(iii) පෘතුගීසීන්හට කෝට්ටේ රාජ්‍යයේ දේශපාලන බලය අත්පත් කර ගැනීමට උපකාරීවූ සිදුවීම් දෙකක් දක්වා ඔවුන් කෝට්ටේ රාජ්‍යයේ දේශපාලන බලය අත්පත් කරගත් අයුරු විස්තර කරන්න. (ල.05)

(iv) උඩරට රාජ්‍ය සම්බන්ධයෙන් ලන්දේසී ප්‍රතිපත්තියේ විශේෂ ලක්ෂණ 03 ක් දක්වා ලන්දේසීන් උඩරට රාජ්‍ය සමග පැවැත්වූ සබඳතා පිළිබඳ විස්තරයක් කරන්න. (ල.06)

(01) (අ) (i) ප්‍රශ්නයට අදාළ ශ්‍රී ලංකා සිතියම



(01) (අ) (ii) ප්‍රශ්නයට අදාළ ලෝක සිතියම



## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(1) | 2 -(1) | 3 -(3) | 4 -(4) | 5 -(3) | 6 -(3) | 7 -(2) | 8 -(4) | 9 -(1) | 10 -(1) |
| 11 -(4) | 12 -(3) | 13 -(1) | 14 -(4) | 15 -(2) | 16 -(3) | 17 -(1) | 18 -(3) | 19 -(2) | 20 -(4) |
| 21 -(3) | 22 -(2) | 23 -(4) | 24 -(1) | 25 -(2) | 26 -(4) | 27 -(1) | 28 -(3) | 29 -(3) | 30 -(1) |
| 31 -(4) | 32 -(4) | 33 -(2) | 34 -(3) | 35 -(1) | 36 -(2) | 37 -(3) | 38 -(2) | 39 -(1) | 40 -(4) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II කොටස

(01) (අ) (i)




(ii)



## I - කොටස

(01) (ආ) (i) A දෙවන රාජසිංහ රජු B මායාදුන්නේ රජු
C දොන්ජෙරනිමෝද අසවේදු D යෝගාර්ණවය

(ii) 1. නටඹුන් පැරණි උදුන හා ප්‍රතිනිර්මාණය කරන ලද උදුන 2. යකඩ නිස්සාරණය කිරීම
3. මරං ගසේ දර (යකඩ මරං) 4. ලිමොනයිට් හෝ හෙමටයිට් (ල.04)

(iii) 1. ගැලීලියෝ ගැලීලි 2. දුරදක්නය
3. චන්ද්‍ර ආවාට, බ්‍රහස්පති උපග්‍රහයන් 4. අත්හදාබැලීමේ පියා (ල.04)

## II - කොටස

(02) (i) දීපවංශය / සිහලට්ඨ කථා මහාවංශය / විනයට්ඨ කථා / උත්තර විහාරට්ඨ කථා / පිංපොත් (ල.03)

(ii) මූලාශ්‍රය රචනා වූ කාලය / මූලාශ්‍රයේ කතුවරයා / කතුවරයාගේ අරමුණු / කරුණු සපයාගත් ආකාරය (ල.04)

(iii) පැරණි ආර්ථික, වෙළඳ, ලෝහ තාක්ෂණ හා විදේශ සබඳතා ආදිය පිළිබඳ තොරතුරු අනාවරණය කරගත හැකි බවත් ඊට අමතරව පැරැන්නන්ගේ නිර්මාණාත්මක හැකියාව, කාසිවල වියදම අනුව පාලන ප්‍රදේශ පිළිබඳ යම් අවබෝධයක් ලැබියහැකි බව විස්තර වීම වැදගත්. (ල.05)

(iv)
- අතීතය පිළිබඳ අත්දැකීම් ලබාගැනීම
- වර්තමානය තේරුම්ගැනමට ප්‍රයෝජනවත් වීම
- අනාගතය සැළසුම් කිරීමට හැකි වීම
- රටේ අනන්‍යතාව තේරුම්ගැනීම
- අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම ආදී තොරතුරු විස්තර කිරීම වැදගත් (ල.06)

03 (i) A - හෝමෝසාපියන්
B - රත්නපුරයට අවට දියළු පස් නිධි වල ඉල්ලම් පස් තට්ටුව ඉරණමඩු සැකැස්ම (ල.03)

(ii) A - රළු ශිලා මෙවලම් B - ජ්‍යාමිතික ක්ෂුද්‍ර ශිලා මෙවලම්
C - කිරිවානා / බිම් වීදුරු D - පීඩන ශල්කනය / වෙරපහන් (ල.04)

(iii) රාවණා ඇල්ල / පාහියංගල / බටදොඹලෙන - දේහය ගුහාවෙන් පිටත වළදමා මස් දියවී ගිය පසු සැකිල්ල ගොඩගෙන හිස්කබලේ ඉදිරියට නෙරා ඇති තැන් ගලක උලා ඔප මට්ටම් කර සැකිල්ලේ එක් පැත්තක ගුරුගල් ආලේපකර සැකිල්ල නවා වකුටුකර ලෙන තුළ වලදැමීම. (ල.04)

(iv) නිවාස ඉදිකිරීම / මැටිවලං නිපදවීම / මැටි ඔරු සුසාන ඉදිකිරීම / ලෝහ මෙවලම් සැකසීම ආදී කාර්යයන් වලදී තාක්ෂණය භාවිතා කළ අයුරු විස්තර කිරීම
- නිවාස ඉදිකිරීම - පොළව ගිලා නොබසින ලෙස සැකසීම, පොළවට ලම්භකව බිත්ති බැඳීම, නොතෙමෙන සේ පියස්ස සැකසීම
- මැටි වලං නිපදවීම - සුදුසු මැටි වර්ගය ගැනීම, සුදුසු පරිදි සැකසීම, සකපෝරුව භාවිතයෙන් බඳුන් නිපදවීම, පිළිස්සීම
- මැටි ඔරු සුසාන - සුදුසු මැටිවර්ගය තෝරා ගැනීම, අවශ්‍ය පරිදි පදම් කිරීම, අවශ්‍ය ඝනකමට බිත්ති සැකසීම, දහනයට වාතය අවශ්‍ය බව (ල.06)

04 (i) A - පරුමක B - තොටබොජක C - පොචනි රජ (ල.03)

(ii) A - පණ්ඩුකාභය රජු B - වසභ රජු
C - කුටකණ්ණතිස්ස රජු D - මහාපරුමක / මපුරුමුකා (ල.04)

(iii) රෝහල් ඉදිකිරීම / වැසිකිළි කැසිකිළි ඉදිකිරීම / ඌරාකැට ලිං - බීමට ජලය / වැව් පොකුණු ඉදිකිරීම - නෑමට..... ආදිය මගින් විස්තර කිරීම (ල.05)

(iv)
- අවට රාජ්‍ය වලින් යුධ ආධාර ලබාගැනීම (ඉලනාග, අභයනාග, මුගලන්)
- විවාහ සබඳතා - විජයබාහු රජු කාලිංග තිලෝක සුන්දරී. විවාහ කර ගැනීම
- ආගමික සබඳතා - පළමුවන ගජබා රජු දකුණු ඉන්දියාවේ චේර රාජ්‍යයේ පත්තිනි දේවාලයක් විවෘත කිරීමට යාම
- කණිට්ඨතිස්ස රජු - රෝමයට දූතයන් යැවීම
- හයවන අග්බෝ රජුගේ අවධියේ විසිවතාවක් දූතයන් චීනයට යාම... ආදි උදාහරණ මගින් විස්තර කිරීම. (ල.06)

05 (i) වෙළෙඳ ප්‍රධානීන් / කප්පිත්තන් / වෛද්‍යවරුන් / ගුරුවරු (ල.03)

(ii) A - ලාහුගල නිල්ගිරි සෑය ලිපිය  B - සද්ධර්මාලංකාරය

C - බ්‍රාහ්මනයාගම ලිපිය  D - වේවැල්කැටිය ලිපිය (ල.04)

(iii) පරිසරය ආරක්ෂා කිරීම සඳහා නීතිරීති අනුගමනය කළ රජවරුන් පිළිබඳ විස්තර උදාහරණ ඇසුරින් මතුකර දැක්වීම අවශ්‍යයි.

- උස් ඉඩම්වල කැලෑ නොකැපිය යුතු බව - අනුරාධපුර පුවරු ලිපිය
- වල් වල දඩුපත් නොකපනු ඉසා - බුද්දන්නේහෙල ලිපිය
- කැලෑවල ගස් කැපිය නොහැකි බව - කොණ්ඩවට්ටවාන් ලිපිය (ල.05)

(iv) නාගරීකරණය ඇතිවීමට බලපාන සාධක විස්තර කර තිබීම. විශාල ඉඩම්, සරුසාර ඉඩම්, ආදායම වැඩිවීම, නගරයට ඇදී යාම, විදේශ භාණ්ඩ පරිභෝජනය ආදිය විස්තර කිරීම.

- පවුරු, ප්‍රාකාර, දියඅගල් උද්‍යාන ආදිය පිහිටා තිබීම
- ආගමික ගොඩනැගිලි
- වෙළඳ පොලවල් පිහිටාතිබීම (ල.06)

06 (i) යාපහුව / ගෝවින්දමලය / මිණිපේ / දඹදෙණිය (ල.03)

(ii) A - ගම්පොළ  B - කෝට්ටේ

C - දඹදෙණිය  D - කුරුණෑගල (ල.04)

(iii)
- වාරිමාර්ග ඉදිකිරීමට තිබූ අවධානය අඩුවීම.
- අහස්දිය මගින් වගාකිරීම.
- වාණිජ්‍ය ආර්ථිකයකට යොමුවීම.
- තෙත් කලාපයේ ඉඩම්වල වැවෙන භෝග වර්ග එක් රැස්කර විදේශරටවලට විකිණීම
- කඳුකර පහත් බිම්වල වගාව
- හෙල්මළු වගාව (ල.05)

(iv)
- කාලිංග මාඝගේ ආක්‍රමණය නිසා ඔහු ලංකාවේ එබඳු බොහෝ පොත්පත් විනාශ කිරීම.
- පාලකයින් අධ්‍යාපනය නගා සිටුවීමට කටයුතු කිරීම.
- අධ්‍යාපනය දියුණු වීම නිසා උගතුන් බිහිවීම.
- උගතුන් පොත්පත් රචනා කිරීම.
- රජවරුන් පොත්පත් රචනා කිරීමට අනුග්‍රහ දැක්වීම.
- රජවරුන් පවා ග්‍රන්ථකරණයේ නිරත වීම.... ආදී කරුණු මගින් විස්තර කර තිබීම. (ල.06)

07 (i) A - සේනාසම්මත වික්‍රමබාහු  B - කෝට්ටේ  C - හයවන පැරකුම් රජතුමා (ල.03)

(ii) A - වීරසුන්දර බණ්ඩාර  B - විජේපාල කුමරුට

C - රාජාධිරාසිංහ රජු  D - දියවඩන නිළමේ තුමාට (ල.0)

(iii)
- නීත්‍යානුකුල රාජ්‍ය උරුමයක් නොමැතිවීම
- උඩරට පෘතුග්‍රීසි පාලනයට නතුකරගැනීමට ගත් උත්සාහය
- සීතාවකින් එල්ලවූ බලපෑම
- පරිහාණියට පත් බුදුදහම නගා සිටුවීම
- ආර්ථිකය දියුණු කිරීමට අවශ්‍ය වීම

<u>ගත් ක්‍රියාමාර්ග :-</u>

- කුසුමාසන දේවිය විවාහ කරගැනීම
- දළදාවහන්සේගේ භාරකාරීත්වය ලබාගැනීම
- සටන් මගින් පෘතුග්‍රීසීන් පරාජය කිරීම
- සීතාවකින් එල්ල වූ ආක්‍රමණ මර්ධනය
- ආර්ථික සංවර්ධනය
- වෙහෙර විහාර අළුත් වැඩියාව, උපසම්පදාව නැවත ඇති කිරීම (ල.02)

(iv)
- පරිපාලනයේ ඉහළම පුද්ගලයා වීම
- ව්‍යවස්ථාදායක කටයුතු
- විධායක කටයුතු
- අධිකරණ කටයුතු
- මරණීය දණ්ඩනය පැනවීමේ හැකියාව
- පෙර සිරිත අනුගමනය කළ යුතු වීම
- ආර්ථික සංවර්ධන කටයුතු
- රට ජාතිය ආරක්ෂාකිරීමේ කටයුතු (ල.02)

## III - කොටස

(08) (i) වටකුරු ආරුක්කු උස් කුළුණු අර්ධ ගෝලාකාර ශිඛර

(ii) A - ජොහැන්ස් ගුටන්බර්ග් B - පෙට්රාක්

C - මයිකල් ආන්ජිලෝ D - ඇමරිගෝ වෙස් පූෂි

(iii)
- ප්‍රාදේශීය පාලනය
- වංශාධිපතිවරුන් ප්‍රදේශපාලනය
- රජුට නිත්‍ය හමුදාවක් නොමැතිබව
- රජුට වඩා බලයක් වංශාධිපතිවරුන්ට හිමිවීම
- එක් ජාතියක්සේ නොසිතීම
- පුනරුද යුගයේ ජාතික රාජ්‍ය බිහිවීම
- ජාතික හැඟීමක් ඇතිවීම
- රජුගේ බලතල වැඩිවීම
- මධ්‍යම පන්තියේ සහය රජුට හිමිවීම
- වංශාධිපතිවරුන්ගේ බලතල අඩුවීම

(iv)
- පුනරුද සමයේ ලංකාව බ්‍රිතාන්‍යයේ යටත් විජිතයක්ව පැවති බව
- ලංකාවේ පැවති රාජාණ්ඩු පාලනය වෙනුවට පාර්ලිමේන්තු පාලන ක්‍රමයක් දායාද වීම
- සම්ප්‍රදායික නිළධාරීන් වෙනුවට බ්‍රිතාන්‍ය නිළධාරී පැලැන්තියක් බිහිවීම
- නව නීතිරීති පද්ධතියක් දායාදවීම
- පරිපාලන ආයතන පද්ධතියක් බිහිවීම

09 (i)
- වෙළඳාම
- ආගම ප්‍රචාරණය
- කීර්තිය ලබා ගැනීම
- වෙළඳපොළ ලබාගැනීම (ල.03)

(ii) A - ඉස්තාන්බුල් B - ෆැන්සිස්කු ද අල්මේදා

C - වීදිය බණ්ඩාර D - කීර්ති ශ්‍රී රාජසිංහ රජු (ල.04)

(iii)
- පෘතුග්‍රීසීන් ලංකාවට පැමිණෙන විට ලංකාව කොටස් දෙකකට බෙදී පැවරීම
- 1521 විජයබා කොල්ලය නිසා කෝට්ටේ රාජ්‍ය කොටස් තුනකට බෙදී වෙන්වීම
- හත්වන බුවනොබාහු රජු මායාදුන්නේ රජුට විරුද්ධව සටන් කිරීමට පෘතුග්‍රීසි සහය පැතීම
- ධර්මපාල රජු තෑගි ඔප්පුවකින් කෝට්ටේ රාජ්‍ය පෘතුග්‍රීසියට පැවරීම
- මල්වානේ ගිවිසුම (ල.05)

(iv)
- ගැටුම්වලින් වැලකී සාමකාමීව කටයුතු කිරීම
- උඩරට රජුගේ හොඳ හිත දිනාගැනීමට ක්‍රියාමාර්ග ගැනීම
- උපසම්පදාව ගෙන එම වැනි ආගමික කටයුතු වලට උදව් කිරීම
- උඩරට රජුට විදේශිකයන් සමඟ ගනුදෙනු කිරීමේ හැකියාව අවහිර කිරීම
- වී වගාව දියුණු කිරීම
- කුරුඳු වගාව
- උඩරට රජවරු හා ලන්දේසීන් සමඟ පැවැත්වූ සබඳතා විස්තර කිරීම
- පෘතුග්‍රීසීන් පලවාහැරීමට උදව් කිරීම
- උඩරට රජවරුන් සමඟ ගිවිසුම් වලට එළඹීම
- උපසම්පදාව ගෙන ඒමට උදව් කිරීම (ල.06)